# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,979 - 2016 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2016.08.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 798 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 799 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 800 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 804 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |


සැ. යු. - අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනත් කෙටුම්පත 2016 මැයි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අගෝස්තු මස 26 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2016 අගෝස්තු මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''

**බී. කේ. එස්. රවීන්ද්‍ර**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents. gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 786

MOD/DEF/03/02/PRO/RNF/01/08.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2016 අප්‍රේල් මස 05 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] නාරායන මුදලිගේ චාමර ජනක පෙරේරා, එන්ආර්ඊ 2310, ශ්‍රීලංනාහ

*2016 අප්‍රේල් මස 17 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] දසනායකගේ දුමින්ද කුමාර දයානන්ද, එන්ආර්එක්ස් 1884, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08 - 133/1

---

2016 අංක 787

MOD/DEF/03/02/PRO/RNF/01/08.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

*2016 මැයි මස 01 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] විමලසුරේන්ද්‍ර මුහම්දිරම් අසංක ශ්‍යාමල් කුමාර මුහම්දිරම්, එන්ආර්එක්ස් 1876, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08 - 133/2

---

2016 අංක 788

MOD/DEF/03/02/PRO/RNF/01/08.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2015 ජුනි මස 20 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) මොහොමඩ් ෂාන් නල්ලවංශ, එන්ආර්එස් 2265, ශ්‍රීලංනාහ

*2016 අප්‍රේල් මස 24 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) රයිගම් බණ්ඩාරනායක මුදලිගේ සක්විති රයිගම්බණ්ඩාර , එන්ආර්පී 2377, ශ්‍රීලංනාහ
ලුතිනන් (නාසෙ) හේරත් මුදියන්සේලාගේ දුෂාන් චාලින්ද හේරත්, එන්ආර්පී 2379, ශ්‍රීලංනාහ

*2016 අප්‍රේල් මස 24 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) ලිලාන් රත්නායක, එන්ආර්ඊ 2391, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජුනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

08 - 133/5

---

2016 අංක 789

MOD/DEF/03/02/PRO/RNF/01/08.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2016 අප්‍රේල් මස 17 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් හේවා පේඩිගේ උදයංග මංජුල කුමාර හේවාසිංහ, එන්ආර්එක්ස් 2359, ශ්‍රීලංනාහ

*2016 මැයි මස 01 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් කරුණාමුණි සංක මදූෂාන් සිල්වා, එන්ආර්එක්ස්, 2358, ශ්‍රීලංනාහ

ලුතිනන් ධනංසූරිය ආරච්චිලාගේ නිශාන්ත ධනංසූරිය, එන්ආර්එක්ස්, 2364, ශ්‍රීලංනාහ

ලුතිනන් සුපුන් ලක්මාල් වික්‍රමසිංහ, එන්ආර්එක්ස්, 2373, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08 - 133/4

2016 අංක 790

MOD/DEF/03/02/PRO/RNF/01/08.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2016 අප්‍රේල් මස 24 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) තිළිණ මධුශංක ජයසිංහ, එන්ආර්ඊ 2388, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08 - 133/3

## වෙනත් පත්කිරීම් ආදිය

2016 අංක 791

**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත් කිරීම්

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ සිංහාර දිමුතු ලතාංගී සිල්වා මිය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (උපායමාර්ගික හා විමර්ශණ) වශයෙන්,
2. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ පනාවල විදානලාගේ චමිල් චින්තන පනාවල මහතා 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයෙක් වශයෙන්,
3. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එම්. කේ. ජී. මොරවක මහත්මිය 2015.11.30 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) වශයෙන්,
4. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ජේ. රාජමල්ලියි මෙනවිය 2016.02.05 දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම්වරයෙක් වශයෙන්,
5. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ වංශතිලක ආරච්චිගේ රෝහණ හේමකුමාර වංශතිලක මහතා 2016.02.17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය) වශයෙන්,
6. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එස්. එන්. බී. කේ. එස්. සේනාරත්න මහතා 2016.02.15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වශයෙන්,
7. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඩී. එන්. සමරවික්‍රම මහත්මිය 2016.01.14 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මුදල්) වශයෙන්,
8. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඩබ්. පී. සන්දනායක මහත්මිය 2016.03.02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වශයෙන්,
9. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ටී. වී. ධනසිංහම් මහත්මිය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ හිමිකම් නිරවුල් කිරීමේ සහකාර කොමසාරිස් වශයෙන්,
10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එස්. එන්. මයාදුන්නේ මෙනවිය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් හිමිකම් නරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයෙක් වශයෙන්,
11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ එල්. එස්. එච්. හේවගේ මහත්මිය 2016.03.31 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) වශයෙන්,
12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ යූ. එච්. සී. ප්‍රියන්ත මහතා 2016.02.01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ අතිරේක ලෙක්ම්වරයෙක් වශයෙන්,
13. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ඒ. එච්. එම්. එල්. අබේරත්න මහතා 2015.12.01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) වශයෙන්,
14. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ඩී. ටී. එෆ්.

සුරවීර මහතා 2016.04.20 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයෙක් වශයෙන්,

15. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ වයි. පරමිතාමන් මහතා 2016.04.18 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් වශයෙන්,
16. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ඩබ්. ඒ. ආර්. වික්‍රමසිංහ මහතා 2016.03.16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයෙක් වශයෙන්,
17. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එස්. එම්. එල්. චන්ද්‍රසිරි මහතා 2016.03.28 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුල්‍ය) වශයෙන්,
18. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ බී. එල්. ඒ. ජේ. ධර්මකීර්ති මහතා 2016.06.07 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වශයෙන්,
19. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එස්. ආර්. එස්. ද සිල්වා මහත්මිය 2016.06.07 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම්වරයෙක් වශයෙන්,
20. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ටී. ඩී. කුමාරදාස මහත්මිය 2016.06.15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ සහකාර ලෙකම්වරයෙක් වශයෙන්,

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2016 ජූලි මස 14 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08 - 35

2016 අංක 792

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

ගුවන් හමුදාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිළයට උසස් කෙරේ.

ෆ්ලයිං ඔෆිසර් වැවලගේ තරිඳු උමේෂ් ප්‍රනාන්දු, (03028) සැපයුම් 2016.06.03
ෆ්ලයිං ඔෆිසර් රවිදු රන්මල් බණ්ඩාර ජයසිංහ, (03131) සැපයුම් 2016.06.13
ෆ්ලයිං ඔෆිසර් සංජීව ප්‍රසාද් කුරගොඩගේ, (03133) සැපයුම් 2016.06.13
ෆ්ලයිං ඔෆිසර් චතුර රුවන් හේවාපතිරණ (03100) පරි/රෙජි 2016.07.03
ෆ්ලයිං ඔෆිසර් ගයාෂාන් බණ්ඩාර රත්නායක, (03108) පරිපාලන 2016.07.03
ෆ්ලයිං ඔෆිසර් බුද්ධික සුගත් නලගමගේ, (03109) පරිපාලන 2016.07.03

ජීපී බුලත්සිංහල,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

2016 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

08 - 57

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/53/2015/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2016.08.05 වැනි දින සිට 2016.08.19 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව

එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2016.08.19 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ආර්. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්.ඩී.ඕ. 422 වෙළුමේ 01 පත්ඉරුව. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රජාංගනය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාසයේ එප්පාවල කෝරලේ අංක 449 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ යාය 06 ගමෙහි පිහිටි ගොඩ ඉඩම සඳහා මායිම්,<br><br>උතුරට : ධනුෂ්ක කුමාරගේ අනවසර ඉඩම,<br>නැගෙනහිරට : නිමල් කරුණාතිලකගේ ඉඩම,<br>දකුණට : පියරත්නගේ ඉඩම,<br>බටහිරට : ආරියරත්න අල්ලාගත් ඉඩම.<br><br>ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 0. | 01. ජනාධිපති ලේකම්ගේ 1997.04.28 වැනි දින අංක අනු/රාජා/ප්‍ර/3923 දරන රජයේ දීමනා පත්‍රය. |

08 - 83

---

**ඉඩම් මැනුම් සභාව**

ඉඩම් අමාත්‍යාංශය

**2002 අංක 17 දරන මැනුම් පනතේ 47 (1) (ආ) වැනි වගන්තිය යටතේ ලියාපදිංචිය අත්හිටුවන ලද මිනින්දෝරුවරුන්ගේ නාමලේඛනය**

| *ලියාපදිංචි අංකය* | *සම්පූර්ණ නම* | *ලියාපදිංචිය අත්හිටුවන ලද කාලය* | *ඉඩම් මැනුම් සභාව විසින් දෝෂ සහිත යැයි තීරණය කරන ලද එම මිනින්දෝරුවරයාගේ පිඹුර/පිඹුරු* |
|---|---|---|---|
| 19920413 | රණතුංග ජයසේකර කෝරාළලාගේ අමරනාත් මහේන්ද්‍ර රණතුංග ජයසේකර | 2016.06.01 සිට 2019.05.31 දක්වා | 2003.07.25 දිනැති 3518 පිඹුර,<br>2003.11.18 දිනැති 3696 පිඹුර,<br>2007.04.21 දිනැති බලයලත් මිනින්දෝරු ඩී. ඒ. විජේසූරිය මයාගේ 2973 පිඹුර<br>2000.11.02 දිනැති 2112 පිඹුර,<br>1999.04.24 දිනැති 11385 පිඹුර, |

| *ලියාපදිංචි අංකය* | *සම්පූර්ණ නම* | *ලියාපදිංචිය අත්හිටුවන ලද කාලය* | *ඉඩම් මැනුම් සභාව විසින් දෝෂ සහිත යැයි තීරණය කරන ලද එම මිනින්දෝරුවරයාගේ පිඹුර/පිඹුරු* |
|---|---|---|---|
| | | | බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා මයාගේ 14397 පිඹුර (1998.03.14) වැනි දින ආර්. ජේ. කේ. ඒ. එම්. ආර්. ජයසේකර මයා විසින් සහතික කර ඇත.) |

පී. එම්. පී. උදයකාන්ත,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

වර්ෂ 2016ක් වූ ජුනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08 - 86

---

**ඉඩම් මැනුම් සභාව**

ඉඩම් අමාත්‍යාංශය

**2002 අංක 17 දරන මැනුම් පනතේ 47 (1) (ඇ) වැනි වගන්තිය යටතේ වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටුවන ලද මිනින්දෝරුවරුන්ගේ නාමලේඛනය**

| *ලියාපදිංචි අංකය* | *සම්පූර්ණ නම* | *ලියාපදිංචිය අත්හිටුවන ලද කාලය* | *ඉඩම් මැනුම් සභාව විසින් දෝෂ සහිත යැයි තීරණය කරන ලද එම මිනින්දෝරුවරයාගේ පිඹුර/පිඹුරු* |
|---|---|---|---|
| (I) 19790048 | රාමනායක කංකානමලාගේ පේමසිංහ රාමනායක | 2016.06.01 සිට 2017.05.31 දක්වා | 2011.02.07 දිනැති 4952 පිඹුර |
| (II) 19760694 | අලුත්වලව්වේ ජෝර්ජ් වේරගම ගිරාගම | 2016.07.01 සිට 2017.06.30 දක්වා | 1995.07.14 දිනැති 3019/1-2 පිඹුර, 1995.07.14 දිනැති 3019/1-2B පිඹුර, 2000.12.04 දිනැති 3019/1 පිඹුර, 2001.05.30 දිනැති 3019/3A පිඹුර, 2001.05.30 දිනැති 3019/3B පිඹුර. |

පී. එම්. පී. උදයකාන්ත,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

වර්ෂ 2016ක් වූ ජුනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08 - 87

**වන්දනා ගමන් ආඥාපනත**

විල්බාව ශ්‍රී පත්තිනි මහා දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍ය - 2016

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, විල්බාව ශ්‍රී පත්තිනි මහා දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍ය 2016 අගෝස්තු මස 20 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කෙරෙන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2016 ජූලි මස 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 131

---

**තැපැල් දෙපාර්තමේන්තුව**

තැපැල් කාර්යාල ආඥා පනතේ 45 වගන්තිය යටතේ සකස් කරනු ලබන රීතියයි

2013.01.01 වැනි දින සිට 2013.12.31 දින දක්වා නිකුත්කල මුදල් ඇණවුම්

මුදල් ඇණවුමක් වලංගු වන්නේ එය නිකුත් කළ මාසයේ අවසන් දින සිට මාස 06ක කාල සීමාවක් සඳහා පමණි. එසේම නිකුත් කළ මාසයේ අවසන් දින සිට අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුමක් නැවත වලංගු කිරීමට හෝ එහි වටිනාකම ආපසු ගෙවීමට හෝ නොහැක. එහෙත් වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුමකට විශේෂ අවස්ථා අනුව සලකා එය නිකුත් කළ මාසයේ අවසන් දිනයේ සිට අවුරුදු 02ක් දක්වා මුදල් ගෙවීම ගැන සලකා බලනු ලැබේ. එසේ නොවන මුදල් ඇණවුම්වල වටිනාකම රජයේ ආදායමට බැර කරනු ලැබේ.

02. එසේ වුවත් පහත සඳහන් විශේෂ අවස්ථා යටතේ අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුම්වල වටිනාකම අදාළ ගාස්තු අයකර ගැනීමෙන් පසු රජයේ ආදායමෙන් ආපසු ගෙවීම ගැන සලකා බැලිය හැක.

I. මුදල් ඇණවුම් අධිකරණය වෙත ඉදිරිපත් කර තිබීම.
II. නීතිමය හේතූන් මත ගෙවල් කුලී පාලක මණ්ඩලයක් මගින් මුදල් ඇණවුම් රඳවාගෙන තිබීම.
III. මුදල් ඇණවුමේ මුදල ලැබිය යුතු අය විදේශගත වී සිටීම. (විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.)
IV. මුදල් ලැබිය යුතු අය දීර්ඝකාලීනව දැඩි අයහපත් සෞඛ්‍ය තත්වයකින් පසු වීම.(රජයේ වෛද්‍ය නිලධාරියකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඒ බව සනාථ කළ යුතු ය)

03. ඉහත 02 (I) හා (II) යටතට අදාල මුදල් ඇණවුම් මෙම *ගැසට් නිවේදනයේ* පළකරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ නොහැකි නම් එවැනි මුදල් ඇණවුම් පිළිබඳ විස්තර අදාළ නඩු අංක ආදිය සමඟ මුදල් ඇණවුම් සේවා පාලක වෙත ලිඛිතව එවිය යුතු ය. මුදල් ඇණවුම් ඉදිරිපත් කිරීමට අපහසු වන්නේ නම් ඒ බව ලිඛිතව දැන්විය යුතු ය.

04. එහෙත් දැනට අධිකරණයේ පවතින නඩු වෙනුවෙන් හා වෙනත් නීතිමය අවශ්‍යතාවයන් සඳහා උසාවි නියෝග මගින් රඳවා ඇති මුදල් ඇණවුම්, ගෙවල් කුලී පාලක මණ්ඩලයක නඩු සම්බන්ධයෙන් රඳවා ගතයුතු මුදල් ඇනවුම් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මට්ටමින් කරගෙන යනු ලබන විනය පරීක්ෂණයක් සඳහා පාදක වූ මුදල් ඇණවුම් මෙමගින් ආවරණය නොවේ.

05. 2013.01.01 වැනි දින සිට 2013.12.31 වැනි දින දක්වා නිකුත් කරන ලද මුදල් ඇණවුම්වලට අදාළව මෙම නිවේදනය පළකල දින සිට මාස තුනක් සම්පූර්ණ වන දින තෙක් ලැබෙන පැමිණිලි පමණක් සලකා බැලීමට තීරණය කර තිබේ. මෙය සාමාන්‍ය මුදල් ඇණවුම්, විදුලි මුදල් ඇණවුම්, ෆැක්ස් මුදල් ඇණවුම් හා වටිනාකම ගෙවා බාර ගන්නා මුදල් ඇණවුම් සඳහා අදාළ වේ. එහෙත් ඉහත 02 ඡේදයේ සඳහන් අවස්ථා යටතේ වූ මුදල් ඇණවුම්වල වටිනාකම රාජ්‍ය ආදායමට බැර කර ඇත්නම් එම මුදල් ඇණවුම්වල වටිනාකම මුදල් රෙගුලාසිවලට අනුව ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස සලකා අදාළ පාර්ශ්වවලට ගෙවීමට කටයුතු කරනු ලැබේ.

06. එබැවින් ඉහත 02 ඡේදයේ සඳහන් පරිදි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවීම ගැන සලකා බැලීම පිණිස ලිඛිතව කරනු ලබන ඉල්ලීම් හා අදාළ මුදල් ඇණවුම් ද සමඟ මුදල් ඇණවුම් සේවා පාලක වෙත පහත සඳහන් ලිපිනයට මෙම *ගැසට් නිවේදනය* පළකල දින සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු බවට ඒ ඒ පළාත් සඳහා, පළාත් පාලන ආයතන, ගෙවල් කුලී පාලක මණ්ඩලය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, රජයේ ආයතන, බැංකු, පුද්ගලික ආයතන සහ මහජනයා වෙත ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පාලක, මුදල් ඇණවුම් සේවා,
මුදල් ඇණවුම් සේවා අංශය,
නියෝජ්‍ය තැපැල්පති (මධ්‍යම) කාර්යාලය,
තැපැල් සංකීර්ණ ගොඩනැගිල්ල,
තැපැල් දෙපාර්තමේන්තුව,
මහනුවර.

07. ඒ අනුව 2013.01.01 වැනි දින සිට 2013.12.31 වැනි දින දක්වා කාලය තුළ නිකුත් කරන ලද මෙම නිවේදනයේ දෙවන ඡේදයේ දැක්වෙන කරුණු හතරට අදාළ නොවන වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවන මෙන් මෙම *ගැසට් නිවේදනය* පලකළ දින සිට මාස තුනකට පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් බාර නොගන්නා බවත්, එවැනි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවනු නොලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

08. 2013.01.01 වැනි දිනට පෙර නිකුත් කරන ලද කිසිදු මුදල් ඇණවුමක් සඳහා කුමන හේතුවක් මත වුව ද කෙරෙන ඉල්ලීම් සඳහා මුදල් ආපසු ගෙවනු නොලබන බව සලකන්න.

එම්.එච්.අබ්දුල් හලීම්,
තැපැල්, තැපැල් සේවා හා
මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය.

08 - 152

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - කුලියාපිටිය ශාඛාව - 028

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.05.28 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් නිලීකා හර්ෂණී වීරකෝන් විසින් 2013.05.30 වැනි දින ලියා සහතික කරන ලද අංක 2957, 2961, හා 2959 දරන උකස්කරයන් මත අබේසිංහ මුදියන්සේලාගේ ජයන්ත අබේසිංහ සහ අබේසිංහ මුදියන්සේලාගේ සමන්තා අබේසිංහ යන අය විසින් ගෙවීම් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ පිළිවෙළින් රුපියල් හැත්තෑ දෙලක්ෂයක (රු. 72,00,000), රුපියල් හැත්තෑ ලක්ෂයක (රු. 70,00,000) හා රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000) මුදලක් බැංකුවට අයවීමට ඇති බැවින්ද, පිළිවෙළින් රුපියල් හැත්තෑ දෙලක්ෂයක (රු. 72,00,000), රුපියල් හැත්තෑ ලක්ෂයක (රු. 70,00,000) හා රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000) ක මුදලක් සඳහා පිළිවෙළින් 2015.01.05 , 2013.06.04 හා 2014.10.31 වැනි දිනයන්හි සිට පිළිවෙළින් සියයට විසිදෙක (22%), සියයට විසිදෙක (22%) හා සියයට විසි තුනයි දශම පහ (23.5%) බැගින් සහ වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදළ මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබ ඇත්නම් ඒවා අඩුකර, පිළිවෙළින් රුපියල් හැත්තෑ දෙලක්ෂයක (රු. 72,00,000) , රුපියල් හැත්තෑ ලක්ෂයක (රු. 70,00,000) හා රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000) ක මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් පිළිවෙළින් එකී අංක 2957, 2961, හා 2959 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

(i) වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, කටුගම්පොල උතුරු කෝරලේ, කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරඹුව ගමේ, පහල වීරඹුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි '' මාරගහමුලවත්ත බස්නාහිර දෙකෙන් පංගුව'' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක මානක තැනගේ 2004.01.03 වැනි දිනැති අංක 3495 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන අක්කර දෙකයි, රූඩ් තුනයි, පර්චස් තිහක් (අ. 02, රූ. 03, පර්. 30) විශාලැති ඉඩම හා ඒ තුළ පිහිටි ගහකොල, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේද සමග වේ. (B, 22/107 - කුලියාපිටිය)

ඉහත කී ඉඩමට මායිම් : උතුරට : රත්නහාමි සහ තවත් අය හිමිකම් කියූ දූනට ටී. පී. ගුණරත්න බණ්ඩා හිමිකම් කියන ඉඩම හා ලොට් අංක 3 දරන පාර, නැගෙනහිරට : ලොට් අංක 2 හා ලොට් අංක 3 දරන පාර, දකුණට : ලොට් අංක 2, බස්නාහිරට : පුංචි බණ්ඩා හිමිකම් කියූ දූනට කේ. ඩබ්. සීලවතී හා රන් බණ්ඩා හිමිකම් කියන දෙරකඩවෙල කුඹුර.

(ii) වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, කටුගම්පොල උතුරු කෝරලේ, කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරඹුව ගමේ, පහල වීරඹුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි "මාරගහමුලවත්ත බස්නාහිර දෙකෙන් පංගුව" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක මානක තැනගේ 2004.01.03 දිනැති අංක 3495 දරන පිඹුරේ ලොට් අංක 02 ලෙස දැක්වෙන අක්කර එකයි, රූඩ් දෙකක් (අ. 01, රූ. 02, පර්. 00) විශාලැති ඉඩම හා ඒ තුල පිහිටි ගහකොල, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියළු දේද සමග වේ. (B 22/108 - කුලියාපිටිය)

ඉහත කී ඉඩමට මායිම් : උතුරට : ලොට් අංක 1 හා ලොට් අංක 3 දරන පාර, නැගෙනහිරට : පුංචි බණ්ඩා හිමිකම් කියූ දූනට එන්. ජේ. පියසේන හිමිකම් කියන ඉඩම, දකුණට : හෙන්ද්‍රික් වෙදරාල හිමිකම් කියූ කුඹුර දූනට මිටිය ගුරා හිමිකම් කියන පිල්ලෑව සහ හෙන්ද්‍රික් වෙදරාල හිමිකම් කියූ දූනට ටී. පී ගුණරත් බණ්ඩා සහ වෙනත් අය හිමිකම් කියන කුඹුර, බස්නාහිරට : පුංචි බණ්ඩාට අයිතිව තිබූ දූනට රන්බණ්ඩා සහ වෙනත් අය හිමිකම් කියන දෙරකඩවෙල කුඹුර.

(iii) වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, කටුගම්පොල උතුරු කෝරලේ, කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරඹුව ගමේ, ඉහල වීරඹුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි '' කහටගහමුලවත්ත'' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. එස්. ජයලත් මානක තැනගේ 2009.08.02 වැනි දිනැති අංක 329 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන අක්කර එකයි, පර්චස් අටයි දශම හයක් (අක්. 01, රූඩ් 00, පර්. 8.60) විශාලැති ඉඩම හා ඒ තුළ පිහිටි ගහකොල, පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියළු දේද සමග වේ. (B. 20/126 - කුලියාපිටිය)

ඉහත කී ඉඩමට මායිම් : උතුරට : අංක 63 පිඹුරේ කැබලි අංක 04 යයි කියන දූනට එච්. එම්. ගාමිණී බන්දුල හේරත් සහ එච්. එම්. අජිත් බන්දුල හේරත් හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට: පිඹුරු අංක 63 හි ලොට් අංක 05 යයි කියන ඉඩම, දකුණට: පිඹුරු අංක 63 හි ලොට් අංක 7 යයි කියන දූනට එච්. එම්. විජේසේන හිමිකම් කියන ඉඩම, බස්නාහිරට : තබ්බෝමුල්ල සිට ප්‍රධාන මාර්ගය දක්වා වූ ප්‍රාදේශීය සභා පාර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකාරිනී.

2015 මැයි මස 22 වැනි දින,
මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 03, වත්හිමි පාර,
කුරුණෑගල.

08 - 111

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පංචිකාවත්ත ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගණුදෙනුකරුගේ නම : ප්‍රින්ට්ලයින් කම්පියුටර් සිස්ටම්ස් ප්‍රයිවට් ලිමිටඩ්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2016 ක්වූ ජුනි මස 29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදි.

එනම්, ඉහතකී ප්‍රින්ට්ලයින් කම්පියුටර් සිස්ටම්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් බන්ධනදායී ලෙස ද, අරවින් නවරත්නම් විසින් උකස්කරු ලෙසද ලියාපදිංචි අංක පී.කිව්.48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී.එස්.එන්. රාජකරුණා විසින් සහතික කරන ලද වර්ෂ 2014 ක් වූ මාර්තු මස 28 වැනි දිනැති අංක 5258 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 5258 දරන උකස්කරය මත, වර්ෂ 2016 ක් වූ මැයි මස 04 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් දස මිලියන හය ලක්ෂ පනස් හත් දහස් නවසිය අටයි ශත තිස් නවය (රු.10,657,908.39) ක මුදලක් ද, වර්ෂ 2016 ක් වූ මැයි මස 05 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් දස මිලියන හය ලක්ෂ තිස් දහස් තිහයි ශත හැට හතක් (රු.10,630,030.67) ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 24% ක පොලිය ද, ඉහතකී බන්ධනදායී සහ උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු එකී රුපියල් දස මිලියන හය ලක්ෂ පනස් හත් දහස් නවසිය අටයි ශත තිස් නවය (රු.10,657,908.39) ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොලිය ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මහනුවර, මාවිල්මඩ දුටුගැමුණු මාවතේ, අංක. 369/1 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි.ඩබ්ලිව්.ජයසූරිය වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

**උපලේඛණය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (ගම්පහ ලියාපදිංචි කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ හැඳල උපකාර්යාල සීමාවේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැඳල දකුණ අංක 172 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, හැඳල ග්‍රාමයේ, අල්විස් නගරයේ පිහිටි ඇල ඉවුර පටුමගේ, වරිපනම් අංක 170/66 දරන නැඳුන්ගහ කුඹුර නැමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩී.ප්‍රසාද් විමලසේන විසින් මැන සාදන ලද 2014.03.28 දිනැති අංක 4953 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 සහ 2 දරන කැබලි ඒකාබද්ධ කොට නැවත බෙදා වෙන් කරන ලද බලයලත් මිනින්දෝරු ඩී.ප්‍රසාද් විමලසේන විසින් මැන සාදන ලද 2004.12.20 දිනැති අංක 4953/ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් 51 නැමැති උතුරින් : මෙම ඉඩමේ ලොට් 52 සහ 50 ද, නැගෙනහිරින් : මෙම පිඹුරේ ලොට් 50 ද, අංක 1487 දරන පිඹුරේ ලොට් 2 ද සහ මෙම පිඹුරේ ලොට් 66 ද, දකුණින්: අංක 4953/ඒ දරන පිඹුරේ ලොට් ආර් 8 ද, බස්නාහිරින් : මෙම ඉඩමෙ ලොට් ආර් 8 සහ 52 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අට (අ: 0, රූ: 0, පර්: 8) *හෙවත්* හෙක්ටයාර් 0.02023 ක් විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් /පත්‍රිරු L 73/04 හි ලියාපදිංචි ඇත.

තවද, පහත දැක්වෙන මාර්ග රක්ෂිතය මතින සහ ඔස්සේ පවතින මාර්ග අයිතිය සහ අනෙකුත් අනුබද්ධ පරවශ අයිතීන්ද සමග වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (ගම්පහ ලියාපදිංචි කොට්ඨාශය තුල) අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ හැඳල උපකාර්යාල සීමාවේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැඳල දකුණ අංක 172 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුල, හැඳල ග්‍රාමයේ, අල්විස් නගරයේ පිහිටි ඇල ඉවුර පටුමගේ, වරිපනම් අංක 170/66 දරන නැඳුන්ගහ කුඹුර නැමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් මැන සාදන ලද 2014.03.28 දිනැති අංක 4953 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 සහ 2 දරන කැබලි ඒකාබද්ධ කොට නැවත බෙදා වෙන් කර බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් මැන සාදන ලද 2004.12.20 දිනැති අංක 4953/ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් ආර් 8 (මීටර් 9 ක් පළල පාර රක්ෂිතය) නැමැති උතුරින් : මෙම පිඹුරේ ලොට් ආර් 7,52,51 66,67,68,71 සහ 72 ද, නැගෙනහිරින් : මෙම පිඹුරේ ලොට් 52,51,66,67,68,71,72 සහ පාර ද, දකුණින් : මෙම පිඹුරේ පාර සහ ලොට් 73,70,69,65,64 සහ 63 ද, බස්නාහිරින් : මෙම පිඹුරේ ලොට් 73,70,69,65,64,63,62 සහ ආර් 5 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනයි දශම එක (අ: 0, රූ: 0, පර්: 33.1) ක් හෙවත් හෙක්ටයාර් 0.04022 ක් විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් / පත්‍රිරු L 73/05 හි ලියාපදිංචි ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණී- ණය අයකර ගැනීම්.

08-138

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - රත්නපුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම :- ශ්‍රී මායා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2016.06.29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ශ්‍රී මායා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් "බන්ධනදායී" වශයෙන්ද, කැටවලගේ අජිත් ප්‍රේමකීර්ති ද විජේසිංහ "උකස්කරු" වශයෙන්ද, කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී.කිව්.48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් සී. දයාරත්න විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.09.25 දිනැති අංක 10121 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

එකී අංක 10121 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂ 2016.05.11 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් විසි එක් ලක්ෂ අසූ නව දහස් හයසිය විසි තුනයි ශත පනස් හතක (රු. 21,89,623.57) මුදල සහ වර්ෂ 2016.05.12 වැනි දින සිට රු. 2,125,848.13 ක මුදල මත වාර්ෂිකව 15.5% බැගින් පොලිය ද, සහ වර්ෂ 2016.05.11 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් විසි එක් ලක්ෂ හැත්තෑ නව දහස් හත්සිය තුනයි ශත හැට අටක (රු. 21,79,703.68) ක මුදල සහ වර්ෂ 2016.05.12 වැනි දින සිට රු. 21,18,240ක මුදල මත වාර්ෂිකව 15.5% බැගින් පොලියද, වර්ෂ 2016.05.11 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් විසි එක් ලක්ෂ පනස් හය දහස් දෙසිය දෙක (රු. 2,156,202) ක මුදල සහ වර්ෂ 2016.05.12 වැනි දින සිට රු. 2,093,400 ක මුදල මත වාර්ෂිකව 15.5% බැගින් පොලිය ද, වර්ෂ 2016.05.11 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් විසි එක් ලක්ෂ පනස් හය දහස් දෙසීය දෙක (රු. 21,56,202)ක මුදල සහ වර්ෂ 2016.05.12 වැනි දින සිට රුපියල් 20,93,400ක මුදල මත වාර්ෂිකව 15.5% බැගින් පොලිය ද, වර්ෂ 2016.05.11 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් විසි හය ලක්ෂ හැත්තෑ එක් දහස් එකසිය පනස් දෙකයි ශත අනූ හතක (රු. 26,71,152.97) මුදල සහ වර්ෂ 2016.05.12 වැනි දින සිට රු. 25,93,490ක මුදල මත වාර්ෂිකව 15.5% බැගින් පොලියද, වර්ෂ 2016.05.11 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් දහසය ලක්ෂ පනස් තුන් දහසයි ශත හතලිස් නවය (රු. 16,53,000.49) ක මුදල සහ වර්ෂ 2016.05.12 වැනි දින සිට රු,16,04,940ක මුදල මත වාර්ෂිකව 15.5% බැගින් පොලිය ද, වර්ෂ 2016.05.11 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් දහසය ලක්ෂ අනූ පන්දහස් තුන්සිය එකොළහයි හැත්තෑ පහක (රු. 16,95,311.75) මුදල සහ වර්ෂ 2016.05.12 වැනි දින සිට රුපියල් 16,45,650ක මුදල මත වාර්ෂිකව 15.5% බැගින් පොලිය ද, වර්ෂ 2016.05.11 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් විසි නව ලක්ෂ දහ අට දහස් එකසිය පනස් හතරයි ශත අසූ හතරක (රු. 29,18,154.84) මුදල සහ වර්ෂ 2016.05.12 වැනි දින සිට රු. 2,735,628.89 ක මුදල මත වාර්ෂිකව 24% බැගින් පොලිය ද, වර්ෂ 2016.05.11 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් අසූ හත් ලක්ෂ දෙදහස් හතලිස් තුනයි ශත තුන (රු. 8,702,043.03) ක මුදල සහ වර්ෂ 2016.05.01 වැනි දින සිට රු. 87,02,043.03 ක මුදල මත වාර්ෂිකව 13.5% බැගින් පොලියද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 10121 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් දෙමිලියන හැට තුන් ලක්ෂ විසි එක් දහස් තුන් සිය අනූ හතරයි ශත තිස් තුන (රු. 2,63,21,394.33) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තුද අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3(50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළේ, දාසියා පත්තුවේ, කටුනායක-සීදූව නගර සභා සීමාව තුළ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටුනායක-දකුණ අංක 143ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කටුනායක ග්‍රාමයේ පිහිටා ඇති 'දවටගහවත්ත කොටස' සහ 'දවටගහවත්ත' නැමැති ඉඩමට බලයලත් මානක පී. එන්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 1995.06.25, 2012.03.02 සහ 2015.07.18 දිනැති අංක 726^AA දරන පිඹුර ප්‍රකාරව ලොට් A වශයෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: සරත් මාවත සහ එච්.ඩී.ෆැන්සිස් අප්පුහාමිගේ ඉඩමද, නැගෙනහිරට : ඩබ්.එම්.ආර්.වින්සන්ට් සහ ජෝර්ජියානා රොඩ්‍රිගෝ යන අයගේ ඉඩම් ද, දකුණට : එච්.ඩී.මැටිල්ඩා සහ ඩී.සේනානායකගේ ඉඩම්ද, සහ බස්නාහිරට : සරත් මාවත ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් හතයි දශම හතයි පහ (අ. 0, රූ. 1, පර් 7.75) ක් *හෙවත්* හෙක්ටයාර් 0.1207ක් වන ඉඩම සහ ඒ මත පිහිටි සෑම සියළු දේත් සමග වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම්/පත්‍රය H 268/100යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම පහත විස්තර කර ඇති ඉඩම් ඒකාබද්ධ කර බෙදා වෙන් කරන ලද්දකි.

1. ඉහත කී කටුනායක ග්‍රාමයේ පිහිටා ඇති 'දවටගහවත්ත' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්.ජේ.එම්.ජී.ඩයස් විසින් මැන සාදන ලද වර්ෂ 1985.09.05 දිනැති අංක 700^A/85 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කර ඇති ඉඩමට මායිම්, උතුරට : එච්.ඩී.ෆැන්සිස් අප්පුහාමිගේ ඉඩම ද, නැගෙනහිරට : ඩබ්. එම්. ආර්. වින්සන්ට් සහ ජෝර්ජියානා රොඩ්‍රිගෝ යන අයගේ ඉඩම් ද, දකුණට : එච්.ඩී.මැටිල්ඩා සහ ඩී. සේනානායකගේ ඉඩම් සහ යූ.

හැරියට් යන අයගේ ඉඩම ද සහ බස්නාහිරට : යූ. හැරියට් යන අයගේ ඉඩම සහ පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් හතර (අ. 0, රූ, 1, පර්. 04) ක් *හෙවත්* හෙක්ටයාර් 0.1113 ක් වන ඉඩම සහ ඒ මත පිහිටි සෑම සියළු දේත් සමග වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම්/පත්‍ඉරු E 979/43 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී කටුනායක ග්‍රාමයේ පිහිටා ඇති, 'දවටගහවත්ත කොටස' නැමැති ඉඩමට බලයලත් මානක පී. ඩී. එන්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 1996.01.25 දිනැති අංක 726 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කර ඇති ලොට් 1 දරන ඉඩමට මායිම්, උතුරට : සරත් මාවත ද, නැගෙනහිරට : ජී. ඒ. ධනපාල කරුණාරත්නගේ ඉඩම ද, දකුණට : ජී. ඒ. ධනපාල කරුණාරත්නගේ ඉඩම ද සහ බස්නාහිරට : ඩී. සේනානායකගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 03.75)ක් *හෙවත්* හෙක්ටයාර් 0.0094ක් වන ඉඩම සහ ඒ මත පිහිටි සෑම සියළු දේත් සමග වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම්/පත්‍ඉරු H 70/26 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

රජිත කරුණාතිලක,
සහකාර කළමනාකරු-අයකර ගැනීම්.

08-151

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

**සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට *www. documents. gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.**

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල | තැපැල් ගාස්තුව | |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | |
| I වැනි කොටස : | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 | |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 | |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 | |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 | |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 | |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 | |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 | |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 | |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 | |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | රු. ශ. | රු. ශ. |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **අගෝස්තු** | 2016.08.05 | සිකුරාදා | 2016.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.12 | සිකුරාදා | 2016.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.19 | සිකුරාදා | 2016.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.26 | සිකුරාදා | 2016.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2016.09.02 | සිකුරාදා | 2016.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.09 | සිකුරාදා | 2016.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.15 | බ්‍රහස්පතින්දා | 2016.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.23 | සිකුරාදා | 2016.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.30 | සිකුරාදා | 2016.09.15 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2016.10.07 | සිකුරාදා | 2016.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.14 | සිකුරාදා | 2016.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.21 | සිකුරාදා | 2016.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.28 | සිකුරාදා | 2016.010.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජුනි මස 21 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.